# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
# විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2014/2015 අධ්‍යයන වර්ෂය
# www.ugc.ac.lk

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම පිණිස, **2014 අගෝස්තු මස පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී** විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් වෙත ඒ බව දැනටමත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් දැනුම් දී ඇත.

**<u>විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සපුරාලිය යුතු අවම සුදුසුකම්:</u>**

විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර ඇති, පහත සඳහන් සුදුසුකම් සපුරාලූ අපේක්ෂකයන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබයි.

(අ) අවස්ථා තුනකට නොවැඩි වාර ගණනක් තුළ එක් වරකදී අනුමත විෂයයන් තුනටම අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.

(ආ) සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයෙන් 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතුය.

සටහන 1: **කෙසේ වෙතත්, ඉහත (ආ) සම්පූර්ණ නොකිරීම හේතුවෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා නොමැති බවට නිවේදනය කර ඇති අපේක්ෂකයන්ටද, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීමට අනුමත අ.පො.ස.(උසස් පෙළ) අවස්ථා තුනෙන් එක් වතාවකදී සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් දැනටමත් ලබා ඇත්නම් හෝ ඉදිරියේදී ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් , විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ හැකිය.**

සටහන 2: **2013 හෝ ඊට පෙර වසරක අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය (SLIATE)යටතේ පවත්නා ආයතනයක් මගින් පවත්වනු ලබන තුන් අවුරුදු හෝ ඊට වැඩි කාලයක උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් (HND)හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ (NAITA) තාක්ෂණදෙයන් පුහුණු කිරීමේ ආයතනයේ (TTI)ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව (NDES) පූර්ණ කාලීනව හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි, එහෙත් ලියාපදිංචිය සඳහා දී තිබූ අවසාන දින සිට දින 60ක් ඇතුළත එම ලියාපදිංචිය අවලංගු කර ගත් සිසුන්ට 2014 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ හැකිය.එවැනි අයදුම්කරුවන් අදාළ ලියාපදිංචිය අවලංගු කර ගත් බවට අදාළ ආයතනය මගින් නිකුත් කරනු ලබන ලිපියේ පිටපතක් අයදුම්පත සමඟ එවිය යුතුය.**

**කෙසේ වෙතත්, පුරප්පාඩු පිරවීම යටතේ ඉහත සඳහන් කරන ලද ආයතනයන් සඳහා තෝරා ගනු ලැබූ සිසුන්ට මෙම සහනය නොලැබේ.**

**විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳ විස්තර ලබා ගැනීමේ ක්‍රමය :**

**2014/2015 අධ්‍යයන වර්ෂයේ සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් යොමුකළ යුතුය.** ඊට අදාළ උපදෙස් ඇතුළත් විශ්වවිද්‍යාල ප්‍රවේශ නීතිරීති සඳහන් අත්පොත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත්කර ඇති බෙදා හැරීමේ නියෝජිතයෙකුගෙන්, **2015 මැයි** 08 දින සිට ලබා ගත හැකිය.

**"ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2014/2015"** නැමැති විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳ අත්පොත සමඟ වෙනම මුද්‍රණය කරන ලද පරිගණක දත්ත පත්‍රිකාවක් (Computer Data Sheet ) සහ විශාල (30 cm X 25 cm ) ප්‍රමාණයේ ලියුම් කවරයක් අයදුම්කරුවන් වෙත නිකුත් කෙරේ. මෙම සියලුම ලිපි ලේඛන විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත මිලදී ගැනීමේදී තමන්ට ලැබී ඇති බවට අයදුම්කරුවන් වග බලා ගත යුතුය.

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රවේශ අත්පොත් අලෙවිකිරීම සඳහා පත්කර ඇති බෙදාහැරීමේ නියෝජිතයින්ගේ ලේඛනයක් මෙහි පහතින් දක්වා ඇති අතර , රු.500/= ක මුදලක් ගෙවා එවැනි නියෝජිතයෙකුගෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳ අත්පොත ලබා ගත හැකිය.

(ii ) තැපැල් මගින්ද ප්‍රවේශ අත්පොත් ලබා ගත හැකි අතර ඒ සඳහා ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස් කිරීමේ ගිණුම් අංක 0002323287 ට හෝ මහජන බැංකුවේ පුරහල ශාඛාවේ රැස්කිරීමේ ගිණුම් අංක 167-1-001-4-3169407ට බැර වන සේ, ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු.500/= ක මුදලක් ගෙවා ලබා ගත් කුවිතාන්සියක් , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලය වෙත එවිය යුතුය. එසේ බැංකු කුවිතාන්සියක් එවා ප්‍රවේශ අත්පොත් තැපැල් මගින් ලබා ගැනීමේදී, අයැදුම්කරුගේ නම හා ප්‍රවේශ අත්පොත අයදුම්කරුට අවශ්‍යය මාධ්‍යය සඳහන් කර තමාගේ ලිපිනය ලියන ලද මුද්දර නොගැසූ 35 cm X 24 cm ප්‍රමාණයේ ලියුම් කවරයක් සමඟ ලිඛිත ඉල්ලීමක් අයදුම්කරුවන් විසින් සහකාර ලේකම් (විශ්වවිද්‍යාල ප්‍රවේශ), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස , කොළඹ 07 යන ලිපිනයට ඉදිරිපත් කළ යුතු අතර නියමිත මුදල් ගෙවූ බවට බැංකු ශාඛාවේ මුද්‍රාව තබා බලය ලත් නිලධාරියකු විසින් බැංකු කුවිතාන්සිය අත්සන් කර තිබිය යුතුය.

**අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම හා භාරදීම**

අයදුම්කරුවන් විසින් **අන්තර්ජාලය හරහා** විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත්‍රය යොමුකළ යුතුය. අන්තර්ජාලය හරහා ඔබගේ ප්‍රවේශ අයදුම්පත්‍රය පිරවීමට අදාළ සියලු උපදෙස් 2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා වූ **ප්‍රවේශ අත්පොතේ තුන්වන කොටසෙහි** අන්තර්ගත වේ.

**අන්තර්ජාල පහසුකම් නොමැති අයදුම්කරුවන්ට දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන (NAC Centers), අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පළාත් සහ ප්‍රාදේශීය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන (ICT Centers ) සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) යටතේ ඇති නැණසල මධ්‍යස්ථානයන්හිදී ඒවා විවෘත කර තබන වේලාවන්හිදී අදාළ කොන්දේසි වලට යටත්ව අන්තර්ජාලය හරහා නම විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත යොමු කිරීමට පහසුකම් සලසා දී ඇත. මෙම මධ්‍යස්ථානවල ලිපිනයන් සහ දුරකථන අංකයන් 2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා වූ ප්‍රවේශ අත්පොතේ ඇමුණුම 7 ලෙස දක්වා ඇත.**

**සටහන 3: අයදුම්කරුවන් අන්තර්ජාලය හරහා තම විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත යොමු කළ පසු ප්‍රවේශ අත්පොත අග දී ඇති ආදර්ශ අයදුම්පත්‍රය පැනෙන් පුරවා එවීම, තැපැල් පත හෝ පරිගණක දත්ත පත්‍රිකාව පුරවා එවීම නොකළ යුතුය.**

**සටහන 4**: කෙසේ වෙතත්, පහත දැක්වෙන කාණ්ඩවලට අයත් අයදුම්කරුවන්ට මෙම ප්‍රවේශ අත්පොතේ අග ඇති ආදර්ශ අයදුම්පත අත්පොතෙන් වෙන් කර අත්පොත මිලදීගැනීමේදී ලැබෙන පරිගණක දත්ත පත්‍රිකාවද සමඟ නිසි පරිදි පුරවා ලියාපදිංචි තැපෑලෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එවීමට අවසර දෙනු ලැබේ.

- 2014 අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටින අවස්ථාවේ ජාතික හැඳුනුම්පතක්, වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ තැපැල් හැඳුනුම්පතක්

ඉදිරිපත් නොකර සහතික කරන ලද ඡායාරූපයක් ඉදිරිපත්කර තම අනන්‍යතාව තහවුරු කළ අපේක්ෂකයින්

- *මේවන විටත් ජාතික හැඳුනුම්පතක් නොමැති අයදුම්කරුවන්*
- *අන්තර්ජාල පහසුකම් නොමැති අයදුම්කරුවන්*

එවැනි අයදුම්කරුවන් සඳහා අදාළ උපදෙස් ප්‍රවේශ අත්පොතේ තුන්වැනි කොටසේ “ඇ” ඡේදය යටතේ දක්වා ඇත.

**අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත පිරවීමේදී යම් ගැටලුවක් ඇති වුවහොත් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (1919) අමතා උපදෙස් ලබාගත හැකිය.**

<u>අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය :</u>

<u>**අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනය 2015 මැයි 29 වැනි දින වේ**</u>. අන්තර්ජාලය මඟින් අයදුම්පත යොමුකිරීමෙන් පසුව ලැබෙන මුද්‍රිත අයදුම්පත අත්පොතෙහි දැක්වෙන උපදෙස් පරිදි අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සහකාර ලේකම් (විශ්වවිද්‍යාල ප්‍රවේශ), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස , කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **2015 මැයි 29දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. මුද්‍රිත ප්‍රවේශ අයදුම්පත් භාරදීම ලියාපදිංචි තැපෑලෙන් පමණක් විය යුතු අතර අයදුම්කරුවන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පැමිණ අයදුම්පත් භාරදිය නොහැකිය.**

<u>ඇතැම් ප්‍රථම උපාධි පාඨමාලාවන්ට ප්‍රවේශ වීමට අයදුම්කරුවන් විසින් සපුරා තිබිය යුතු පූර්ව අවශ්‍යතා</u>

**සටහන 5: සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෙද සේවයට බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය අනුව හෙද පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීම සඳහා නම් අයදුම්කරුවන්ගේ උස 4’ 10” හෝ ඊට වඩා වැඩි විය යුතු අතර හෙද තනතුරට අදාළ වගකීම් ඉටුකිරීමට තරම් ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්වයක් තිබිය යුතුය. හෙද පාඨමාලාව සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන සිසුන් තම උස සහ කායික යෝග්‍යතාව පිළිබඳ සත්‍ය සහ නිවැරදි තොරතුරු ප්‍රවේශ අයදුම්පතෙහි ඇතුළත් කළයුතුය.**

**කෙසේ වෙතත් , හෙද සේවයට බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ලබාදෙන මුළු පත්වීම් සංඛ්‍යාවෙන් 5% ක් පමණක් පිරිමි හෙද නිලධාරීන් සඳහා ලබා දෙනු ඇත.**

2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා **නගර හා ග්‍රාම නිර්මාණය** උපාධි පාඨමාලාවට ප්‍රවේශවීමට සුදුසුකම් ලැබීම සඳහා අයදුම්කරුවන් විසින් ප්‍රවේශ අත්පොතේ දක්වා ඇති පරිදි අ.පො.ස.(උසස් පෙළ) විභාගයේදී සපුරාලියයුතු විෂය පූර්ව අවශ්‍යතා 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට පහත දක්වා ඇති පරිදි සංශෝධනය කෙරෙන බව අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

**සටහන 6 : ප්‍රවේශ අත්පොතේ 8.6.3 ඡේදය යටතේ දක්වා ඇති පරිදි 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට නගර හා ග්‍රාම නිර්මාණය උපාධි පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අයදුම්කරුවන් ගිණුම්කරණය, රසායන විද්‍යාව, උසස් ගණිතය, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය, ජීව විද්‍යාව, ආර්ථික විද්‍යාව, ගණිතය, ව්‍යාපාර අධ්‍යයන, දේශපාලන විද්‍යාවේ මූලිකාංග, භෞතික විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය, භූගෝල විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වී තිබිය යුතුය.**

එසේම 2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා **නිර්මාණවේදය, සන්නිවේදන අධ්‍යයන, නගර හා ග්‍රාම නිර්මාණය** යන උපාධි පාඨමාලාවන්ට ප්‍රවේශ වීමට සුදුසුකම් ලැබීම සඳහා අයදුම්කරුවන් විසින් ප්‍රවේශ අත්පොතේ දක්වා ඇති පරිදි අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව, යන විෂයයන්ට අවම වශයෙන් ලබා තිබිය යුතු සාමාර්ථයන් 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට පහත පරිදි සංශෝධනය වන බව අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

**සටහන 7:**

- ***2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට නිර්මාණවේදය පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අයදුම්කරුවන් අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට සාමාන්‍ය (S) සාමාර්ථයක් සහ ගණිතය විෂයට සම්මාන (C) සාමාර්ථයක් ලබා ගැනීමට අමතරව විද්‍යාව විෂයටද අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.***

- ***2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට සන්නිවේදන අධ්‍යයන පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අයදුම්කරුවන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් (B) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.***

- ***2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට නගර හා ග්‍රාම නිර්මාණය පාඨමාලාවට සුදුසුකම් ලැබීම පිණිස අයදුම්කරුවන් විසින් අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී අවම වශයෙන් ඉංග්‍රීසි විෂයට (B) සාමාර්ථයක් සහ ගණිතය විෂයට සම්මාන(C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.***

එසේම පහත දැක්වෙන අධ්‍යයන පාඨමාලාවන් සඳහා ඇතුළත්වීමට අදහස් කරන අපේක්ෂකයන් අදාළ විශ්වවිද්‍යාල මගින් පවත්වන යෝග්‍යතා පරීක්ෂණයකට ද පෙනී සිටීම සඳහා ඉල්ලුම් කර එය සමත් වියයුතුය. **අදාළ විශ්වවිද්‍යාල පුවත්පත් දැන්වීමක් මගින් යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර ඒ පිළිබඳ වැඩි විස්තර අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීගෙන් හෝ අදාළ ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීගෙන් ලබා ගත හැකිය.**

| **පාඨමාලා** | **විශ්වවිද්‍යාලය / මණ්ඩපය / ආයතනය** |
|---|---|
| කලා (SP) - ජනමාධ්‍ය | ශ්‍රීපාලි |
| වාස්තු විද්‍යාව | මොරටුව |
| නිර්මාණවේදය | මොරටුව |
| කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය | කැළණිය |
| විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය | මොරටුව |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | රජරට වව්නියා |
| කලා (SP) - ප්‍රසංග කලා | ශ්‍රීපාලි |
| විද්‍යාව සහ තාක්ෂණය | ඌව වෙල්ලස්ස |
| පරිගණක විද්‍යාව සහ තාක්ෂණය | ඌව වෙල්ලස්ස |
| ව්‍යවසායකත්වය සහ කළමනාකරණය | ඌව වෙල්ලස්ස |
| සත්ත්ව පාලන විද්‍යාව | ඌව වෙල්ලස්ස |
| සංගීතය * | සෞ.ක.වි. ස් වි.සෞ.අ රා.ඇ. |
| නැටුම් * | සෞ.ක.වි. ස් වි.සෞ.අ රා.ඇ. |
| චිත්‍ර සහ නිර්මාණ | රා.ඇ. |
| නාට්‍ය සහ රංග කලා * | සෞ.ක.වි. ස් වි.සෞ.අ |
| දෘශ්‍ය සහ තාක්ෂණික කලා | ස් වි.සෞ.අ |
| අපනයන කෘෂිකර්මය | ඌව වෙල්ලස්ස |
| තේ තාක්ෂණය සහ අගය වැඩි කිරීම | ඌව වෙල්ලස්ස |
| කාර්මික තොරතුරු තාක්ෂණය | ඌව වෙල්ලස්ස |
| ඛනිජ සම්පත් සහ තාක්ෂණය | ඌව වෙල්ලස්ස |
| ශාරීරික අධ්‍යාපනය | සබරගමුව |
| ක්‍රීඩා විද්‍යාව හා කළමණාකරණය | සබරගමුව ශ්‍රී.ජ.වි |
| දෘශ්‍ය කලා * | සෞ.ක.වි. |
| ජලජ සම්පත් තාක්ෂණය | ඌව වෙල්ලස්ස |
| පාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම | ඌව වෙල්ලස්ස |
| ආගන්තුක සත්කාර , සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | ඌව වෙල්ලස්ස |
| තොරතුරු පද්ධති | කො.වි.ප.අ |
| භූමි නිර්මාණවේදය | මොරටුව |
| පරිවර්තන අධ්‍යයන | කැළණිය සබරගමුව යාපනය |
| සිනමා හා රූපවාහිනී අධ්‍යයන | කැළණිය |

ශ්‍රී.ජ.වි - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
කො.වි.ප.අ. - කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය
සෞ.ක.වි. - සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
රා.ඇ. - රාමනාදන් ඇකඩමිය
ස්.වි.සෞ.අ - ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය

* සංගීතය, නැටුම්, නාට්‍ය සහ රංග කලා හා දෘශ්‍ය කලා යන පාඨමාලාවන් සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය මගින් ප්‍රායෝගික පරීක්ෂණයන් පවත්වනු ඇත.

**සටහන 8:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා අදාල කඩඉම් ලකුණු නිකුත් කිරීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරාගනු ලබන සිසුන් අදාල පාඨමාලා හා විශ්වවිද්‍යාල සඳහා ලියාපදිංචි කිරීම ප්‍රවේශ අත්පොතේ 11.4 ඡේදයේ යටතේ දැක්වෙන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා සිදුකිරීමට කටයුතු සැලසුම් කර ඇත.

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තෝරාගනු ලබන සිසුන්ට ඒ පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැනුම් දෙනු ලැබේ.

**සටහන 9:** විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවන අතර වාරයේ හෝ ඉන්පසුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2014 අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ නැවත සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමට ඉඩඇත. එවිට අයදුම්කරුවන්ගේ Z අගයෙහි සිදුවන වෙනස්කම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් තහවුරුකරගෙන නිවැරදි Z අගය අයදුම්කරුගේ අයදුම්පතට ඇතුලත් කරනු ලැබේ . එබැවින් ප්‍රතඵල නැවත සමීක්ෂණයෙන් පෙර හෝ පසු යන කුමන Z අගය ඔබගේ අයදුම්පතෙහි ඇතුලත්ව තිබුණද එය ගැටලුවක් නොවන බව සලකන්න. නැවත සමීක්ෂණයෙන් පසුව ඔබගේ ප්‍රතිඵල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් පරීක්ෂා කල හැකිය.(www.doenets.lk).

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**බෙදා හැරීමේ නියෝජිතයින්**

01. කොළඹ -

එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, මරදාන පාර, කොළඹ 10.
සදීපා පොත් හල, 1060, මරදාන පාර, බොරැල්ල, කොළඹ 08.
විජිතයාපා පොත්හල,130,එස් ද එස් ජයසිංහ මාවත, කොහුවල, නුගේගොඩ.
විජිතයාපා පොත්හල,යුනිටි ප්ලාසා,02,ගාලු පාර, කොළඹ 04.
විජිතයාපා පොත්හල,32,තර්ස්ටන් පාර, කොළඹ 03.
විජිතයාපා පොත්හල,ජී6 ඒ,ක්‍රෙස්කැට් බෝල්වර්ඩ්, කොළඹ 03.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම ,30 ,ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම, 44 / 9 වයි.එම්.බී.ඒ. ගොඩනැගිල්ල, කොටුව.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම ,1/50, වයි.එම්.බී.ඒ. ගොඩනැගිල්ල, බොරැල්ල.
සරසවි පොත්හල (පුද්ගලික) සමාගම , 74, හයිලෙවෙල් පාර, මහරගම.
සසිරි (ප්‍රයිවට්) ලිමිටඩ්, 14, හයිලෙවල් පාර, මහරගම.
සරසවි මාර්කටිං එන්ටර්ප්‍රයිසස්, යූජී19,පීපල්ස් පාක්,ගුණසිංහ පුර, කොළඹ 11.
පූබාලසිංහම් පොත් වෙළඳ සැල, 340,හෙට්ටි වීදිය , කොළඹ 11.
තුසිත පොත්හල (පුද්ගලික) සමාගම,433 Q ,ගාලු පාර, රත්මලාන.
සිතුරුවන පොත්හල, නො.08, ඉංගිරිය පාර, පාදුක්ක.
වික්ටරි පොත්හල,21, යටියන්තොට පාර , අවිස්සාවේල්ල.
සැනිල පොත් හල,323, කඩුවෙල පාර, බත්තරමුල්ල.
නුවණැස පොත්හල සහ මුද්‍රණාලය, 56, කෙලින් වීදිය, බත්තරමුල්ල.
සිවලී පොත්හල, ඒ/39, හරස්පාර, හංවැල්ල.
සිතුමිණ පොත් හල,අංක 62 ,කෙලින් වීදිය,අතුරුගිරිය.
සමුද්‍රා පොත්හල,නො 1141, මරදාන පාර,බොරැල්ල.
සුභසාධක සංගමය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.
සඳලි පොත්හල, 76/4, සේනානායක සංකීර්ණය, හෝමාගම.
ස්ටයිලිස් පොත්හල, 18 /බී, ද මැල් පටුමග, මොරටුව.

02. ගම්පහ -

ශාන්ති පොත්හල,50,කෙලින් වීදිය, ගම්පහ.
කේ.ඒ. ආරියදාස සහ සමාගම,32, කෙලින් වීදිය,වේයන්ගොඩ.
සම්පත් පාලිත ද සේරම් පොත් සමාගම,අංක 60,සම්පත් ෆිනෑන්ස් බිල්ඩිං ,නුවර පාර, කිරිබත්ගොඩ.

සරසවි පොත්හල ( පුද්ගලික ) සමාගම , 87, මිනුවන්ගොඩ පාර,
ගම්පහ.
විජේතයාපා පොත්හල, 135 , රාජපක්ෂ බ්‍රෝඩ්වේ, මීගමුව.
රෝහන පොත්හල සහ හාඩ්වෙයාර් ස්ටෝර්ස්, නව නුවර පාර,
දෙල්ගොඩ.
දිලීපා පොත්හල , නො 07 , පස්යාල පාර , මීරිගම.
ගංගා පොත්හල , 134 , නුවර පාර, නිට්ටඹුව.
සරසවි පොත්හල, නො.36, කෙලින් වීදිය, ගම්පහ.
පර්නෝ ස්ටේෂනරිස්, නො.92, මිගමු පාර, ජා ඇල.
සරසවි පොත් හල, නො.37, මීරිගම.
මහජන පොත්හල ,141, සේරම් ගොඩනැගිල්ල, නුවර පාර ,කඩවත.
ආසිරි ට්‍රේඩර්ස් ,නො,18 කුරුණෑගල පාර, මිනුවන්ගොඩ.
දිස්නා පොත්හල , නො 650, අත්තනගල්ල පාර , නිට්ටඹුව.
වන්මිනි පොත්හල,20/5,පස්යාල පාර ,මීරිගම.

03. කළුතර - ඕකිඩ් එන්ටප්‍රයිසස් , 109, අගුරුවාතොට පාර, හොරණ.
විජය පොත්හල, 20, අලුත්ගම පාර,මතුගම.
නිව් ඕවන් ජෝසප් පොත් හල ,240, කෙලින් වීදිය, කළුතර දකුණ.
ලක් ඉසුරු පුද්ගලික සමාගම,324,කෙලින් වීදිය, පානදුර.
නිව් ප්‍රදීපා පොත්හල, නො.51/සී, කළුතර පාර, බණ්ඩාරගම.
නව නිපුන පොත්හල,404,තුංමං හංදිය , ගාළුපාර, කළුතර දකුණ.
වාද්දුව පොත්හල,ගාලු පාර, වාද්දුව.
ලුම්නෙක්ස් ග්‍රොසරිස් ප්‍රයිවෙට් ලිමිටඩ්,465 ,ගාලුපාර ,පානදුර.
ගොඩගේ සහ සහෝදරයෝ ,507 ,ගාලුපාර ,පානදුර.

04. මාතලේ - මාලක ට්‍රේඩර්ස් පෞද්ගලික සමාගම ,55/57,කෙලින් වීදිය, මාතලේ.
අමරසිංහ සහ පුත්‍රයෝ, නො.07, දඹුල්ල පාර, මාතලේ හන්දිය,
ගලේවෙල.

05. මහනුවර - විජේතයාපා පොත්හල, 05,කොටුගොඩැල්ල වීදිය, මහනුවර.
දවස පොත් මැදුර ,අංක 12,නුවරඑළිය වීදිය, ගම්පොල.
සරසවි පොත්හල ( පුද්ගලික ) සමාගම , 86, ඩී.එස්.සේනානායක වීදිය,
මහනුවර.
හරිස්චන්ද්‍ර පොත් මැදුර, නො.36,හරස් වීදිය, මහනුවර.
ලංකා මධ්‍යම පොත් හල, නො.84,කොළඹ වීදිය, මහනුවර.
සමුද්‍රා පොත්හල, පේරාදෙණිය පාර ,මහනුවර.
සීවලී පොත්හල , නො.16,යටිනුවර වීදිය, මහනුවර.
විමර්ශි අධ්‍යයන කවය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.

06. නුවරඑළිය - කුමාරන්ස් ට්‍රේඩ් (පොත්) සෙන්ටර්, 19,ඩේලිෆෙයාර් කොම්ප්ලෙක්ස් ,
මහනුවර පාර, නුවරඑළිය.
නිෂාන් පොත්හල,රත්මැටිය පාර,රිකිල්ලගස්කඩ.
වීජ් සයිඩ් පොත්හල , නො 40 , ගම්පොල පාර , නාවලපිටිය.
චමිලානි කොමියුනිකේෂන්, නො.01,පොදුවෙළඳ පොල,හඟුරන්කෙත.
සමගි පොත්හල,රෝහල පාර ,රිකිල්ලගස්කඩ.

07. ගාල්ල - විජේතයාපා පොත්හල,නො.12 ,වක්වැල්ල පාර ,ගාල්ල.
පී.එච්. ආරියදාස පොත්හල,73,දංගෙදර වීදිය,ගාල්ල.
රෝයල් පොත්හල,152,මහ වීදිය ,අම්බලංගොඩ.
විතාන පොත්හල, 04, බද්දේගම පාර, වදුරඹ.
සේන පොත්හල ,ඇල්පිටිය .
ලහිරු පොත්හල , බාසර, 76, හැව්ලොක් පාර, ගාල්ල.
තුසිත පොත්හල , නො.60, ඕල්කට් මාවත,ගාල්ල.
සමනල ට්‍රේඩර්ස් සහ පොත්හල ,කොළඹ පාර ,නෙළුව.
ගමගේ පොත්හල, නො 20, නාගොඩ පාර, බද්දේගම.

08. මාතර - එච්. බී. එරමානිස් අප්පුහාමි සහ පුත්‍රයෝ,87, ධර්මපාල මාවත, මාතර.
වීරසිංහ පොත්හල,මාතර පාර,කඹුරුපිටිය.
සරසවි පොත්හල ( පුද්ගලික ) සමාගම ,74, කුමාරතුංග මාවත ,
මාතර.
විජේතයාපා පොත්හල, 5ඒ- 1/1 , ධර්මපාල මාවත ,මාතර.
හම්මි පොත්හල , නො.07, බෝරාල පාර, වැලිගම.

නිව්පාල ස්ටෝර්ස්,නො.306, පරණ ගාලු පාර, සාප්පුකඩේ , වැලිගම.
ලස්සන පොත්හල,දෙනියාය පාර, මොරවක.
සැෂුකො ඩේටා බියුරෝ සහ පොත්හල, අංක 93,වර්ල්ඩ් මාර්කට්,අකුරැස්ස.
සමුද්‍රා පොත්හල ,නො 127, එස් කේ සිනමා බිල්ඩින් ,නංගල්ල පාර, කොටුවේගොඩ ,මාතර.
අබේවික්‍රම පොත්හල ,වීරකොන් වත්ත , ඌරුබොක්ක .

09. හම්බන්තොට - මුතුමාල පොත්හල , 117, මහ වීදිය,තංගල්ල.
එම්.ඒ.එස්. ට්‍රේඩර්ස් ,24,සුපර් මාර්කට් , වලස්මුල්ල.
රුක්සෙවන පොත් මැදුර ,92,දික්වැල්ල පාර, බෙලිඅත්ත.
ජයසේකර ප්‍රකාශකයෝ, අංක 92, බෙලිඅත්ත පාර, තංගල්ල.
පබසර පොත්හල, 56 , කොටබෝව , වීරකැටිය.
නව සුමිහිරි ට්‍රේඩ් සෙන්ටර්,නො 11,මහ වීදිය , අම්බලන්තොට.
නිව් ලහිරු පොත්හල, 562, හම්බන්තොට පාර, ගගසිරිපුර, තිස්සමහාරාමය.

10. යාපනය - පූබාලසිංහම් පොත්හල,04,රෝහල පාර ,යාපනය.
මැක්මිලන් පොත්හල, නො. 03, බස්නැවතුම්පල,යාපනය.
තුර්කා ස්ටේෂනර්ස්, බස් නැවතුම ,චුන්නාකම්.
අන්නායි පොත්හල,නො.7Z , රෝහල පාර,යාපනය.

11. වව්නියාව - රාමචන්ද්‍රරාස් ,අංක 20 ඒ ,බස්නැවතුම්පොළ සංකීර්ණය ,වව්නියාව.

12. ත්‍රිකුණාමලය - රේන්බෝ මිනිලැබ් (පුද්ගලික) සමාගම ,113,විද්‍යාල පාර, ත්‍රිකුණාමලය .
සූර්ගා කමියුනිකේෂන් ස්ටේෂනරීස් ඇන්ඩ් මල්ටි ට්‍රේඩර්ස් , 160,කෙලින් වීදිය , කින්නියා-03.

13. මඩකලපුව - රාජාස් පොත්හල, 111 , කෙලින් වීදිය, මඩකලපුව.
නූරි පොත් හල, කෙලින් වීදිය,කත්තන්කුඩි .

14. අම්පාර - පොටෝ රියෝ ,120 ඒ , කෙලින් වීදිය , කල්මුනේ.
සෙන්ට්‍රල් පොත්හල, පොතුවිල් පාර, අක්කරෙයිපත්තු.
වැලිගම ස්ටෝර්ස්,4 වැනි පටුමග, අම්පාර.
A 2 Z පොත්හල, 154, රෝහල පාර, නින්තාවූර්15.
වේගා කොමියුනිකේෂන් ,130/3, ෆවුස් මාවත, සමන්තුරෙයි.

15. පුත්තලම - සමන්ති පොත්හල,39, මාරවිල පාර , නාත්තණ්ඩිය.
ද පේපර් හවුස් ,12,කොළඹ පාර, පුත්තලම.
මයුර පොත්හල,08, කොළඹ පාර, හලාවත.

16. කුරුණෑගල - සමුද්‍රා පොත්හල,10,පුත්තලම් පාර, කුරුණෑගල.
කාරිස් පොත්හල, 577, මීගහකොටුව , කුලියාපිටිය.
සරසවි මුද්‍රණ ශිල්පීන් සහ ප්‍රකාශකයෝ , 24 ,දඹුල්ල පාර,කුරුණෑගල.
රිචඩ් ට්‍රේඩින් කම්පැනි ( පුද්ගලික) සමාගම , 64 , පැරකුම්බා වීදිය, කුරුණෑගල.
සරසවි මාර්කටින් එන්ටර්ප්‍රයිසස් ,135, කොළඹ පාර ,කුරුණෑගල.
චතුරංග පොත්හල, නො.60, කුරුණෑගල පාර, පන්නල.
මිහිර පොත්හල ,41, හලාවත පාර, වාරියපොල.
සමාධි පොත්හල ,අංක 7-8 , නව බස් නැවතුම්පල, ගල්ගමුව.
යස ඉසුරු බුක් ෂොප් ඇන්ඩ් ට්‍රේඩ් සෙන්ටර්, 39 , කුලියාපිටිය පාර, නාරම්මල.
පවිත්‍රා පොත්හල කෙලින් වීදිය ,මහව.

17. අනුරාධපුරය - ගුණසේකර සහ සමාගම, 234, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුරය.
බුද්ධික පොත්හල , 282 , මහ වීදිය , බැංකු පෙදෙස , අනුරාධපුරය.
සංජීව ෆාමසි හා පොත්හල , 136 , කෙලින් වීදිය , කැකිරාව.
මුතුකුඩ පේපර් කෝනර් සහ ප්‍රින්ටර්ස් , නවනගරය , තඹුත්තේගම.
මුතුකුඩ පේපර් කෝනර්,නො.34, කැකිරාව පාර,එප්පාවෙල.

18. පොළොන්නරුව - දීපානි පොත්හල , 70 , පොදු වෙළඳපල , හිඟුරක්ගොඩ.
පුවාසා පොත් මැදුර, රෝහල හන්දිය, පොළොන්නරුව.
පෙපර් ලයිට් පොත්හල, රෝහල පාර, මැදිරිගිරිය.

19. බදුල්ල - ජාන්ස් පොත් වෙළඳ සැල , 89 , පහල වීදිය , බදුල්ල.
ඊ. එම්. ජී. කරුණාරත්න පොත් වෙළඳ සැල ,58, ධර්ම විජය මාවත ,
බණ්ඩාරවෙල.
ඉසුරු ෆෙයාර්,80,නුවරඑළිය පාර, වැලිමඩ.
මහින්දාස් පොත්හල , නො.50,52,බසාර් විදය,බදුල්ල.
රිෂානා පික්චර්ස් පැලස්, 394,කෙලින් වීදිය, පස්සර.
සිරිමංගල ප්‍රකාශකයෝ,අංක 16 ධර්මවිජය මාවත,බණ්ඩාරවෙල.

20. මොණරාගල - මයිසන් ට්‍රේඩ් සෙන්ටර් , අංක 26 ,කෙලින් වීදිය , මොණරාගල.
ඒ.ඩී.එස්. ඒජන්සීස් , අංක 14 , මහ වීදිය , බිබිල.
තරිඳු ගිෆ්ට් සෙන්ටර්, 65, තිස්ස පාර ,වැල්ලවාය.
සුමධුර පොත්හල,අංක 22,පොතුවිල් පාර,මොණරාගල.
සී ජී එම් පොත් මැදුර , 69 , බස් නැවතුම ඉදිරිපිට ,වැල්ලවාය.

21. කෑගල්ල - ශ්‍රී ලංකා පොත්හල , 89 , උසාවිය හන්දිය , කෑගල්ල.
ධර්මවර්ධන පොත්හල, බස් නැවතුම, නො.01,පහත මාලය,
අඟුරුවැල්ල,රුවන්වැල්ල.
ලංකා පොත්හල , 122 , කෙලින් විදිය , වරකාපොල.
A.J. කොමියුනිකේෂන් සහ පොත්හල ,21 A ,උසාවිය පාර, මාවනැල්ල .
ජයන්ති පොත්හල, 132, කෙලින් වීදිය, මාවනැල්ල.

22. රත්නපුර - කරුණාරත්න සහෝදරයෝ , 16 , පල්ලිය පාර ,රත්නපුර.
ජිනසිරි ට්‍රේඩ් සෙන්ටර්, 96 කෙලින් වීදිය, බලන්ගොඩ.
සුමනගිරි ට්‍රේඩ් සෙන්ටර් , කෙලින් වීදිය, ඇඹිලිපිටිය.
සින්කා පොත් මැදුර ,බස්නැවතුම්පල, කුරුවිට.
පත්මසිරි සුපර්සිටි,අංක 54,මතුගම පාර, මානාන ,කලවාන.
කුරුළු පොත්හල හා කොමියුනිකේෂන්, 79 / ජී ,කෙලින් වීදිය,
පැල්මඩුල්ල.
සමනල ග්‍රොසරීස් සහ කොමියුනිකේෂන්, 52 , ඉඩංගොඩ , කිරිඇල්ල.
සරසවි පොත්හල( පුද්ගලික සමගම) , නො 23 /1, සෙනවිරත්න
ගොඩනැගිල්ල, පළමු මහල, කොළඹ පාර, රත්නපුර.

අංක 20 , වෝඩ් පෙදෙස,
කොළඹ 07.
2015-05-08